**හැටන් දික්ඔය නගර සභාව - 2023**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හැටන් දික්ඔය නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හැටන් දික්ඔය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ
------------------------------------------------------------------------

1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් බාහිර පාර්ශව වෙත පවරන ලද හා බාහිර පාර්ශව විසින් සභාවට එරෙහිව පනවන ලද නඩු 08 ක් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට පැවතියද, ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී සොයා බලා කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරවු කිරීමට පියවර ගත යුතුය. |

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් 06 ක වටිනාකම රු.168,850 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණු අතර එකතුව රු. 555,018 ක වත්කම් ඒකක 14 ක් ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 854,769 ක තොග ඒකක 15 ක් හා රු. 280,414 ක ලිපිද්‍රව්‍ය ඒකක 21 ක් ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.1,694,940 ක්ද වැඩියෙන්ද, ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 227,000 ක් අඩුවෙන්ද ගිණුම් ගත කර තිබුණි. | - එම - | - එම - |
| (ඈ) | සභාව පරිහරණය කරන රු. 446,012 ක වාහන 05ක් ගිණුම් ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඉ) | පුස්තකාල පොත් 3962 ක් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මිල තීරණය කිරිමට කමිටුවක් පත් කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

1.6.3. නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට මුල්‍ය ප්‍රකාශ වල දැක්වෙන ගිණුම් ශේෂ 06 ක ශේෂයන් ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසැඳීමේදී රු.23,681,605 ක නොසැසඳීමක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 27,650,412 ක ස්ථාවර වත්කම් 04 කට සහ 2009 වර්ෂයේ සහ 2010 වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු හිඟ වැටුප් ලෙස ගිණුමේ පෙන්වා තිබුණු රු.7,043,260 ක ශේෂයට අදාළ ලේඛන ලිපිගොනු ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා එලදායී ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී අදාළ ලේඛන ඉදිරිපත් කරන බව | තහවුරු ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

1.7 අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| i. | මු.රේ 104 (3) හා (4) | 2020 ජනවාරි 28 දින හදිසි ගින්නකින් හානි වූ තානායම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් වර්ෂ තුනක කාලයක් ගත වී තිබුණද, පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි. | තානායමේ මෙම නගර සභාව සතු භාණ්ඩ තිබු බවට ඉන්වෙන්ට්‍රි ලේඛනයක් නොමැති බැවින් මු.රෙ 104 (4) පරීක්ෂණයක් සිදු කර නොමැති බව | දේපලවල ආරක්ෂාව තහවුරු කළ යුතුය. |
| ii. | මු.රේ 371 (5) | කාර්ය නිමකළ වහාම අත්තිකාරම් පියවිය යුතු වුවද,1987 සිට 2023 දක්වා කාල පරාසයක සිට පවත්නා, රු. 617,174 ක් වටිනා අත්තිකාරම් 49 ක් පියවීමට කටයුතුකර නොතිබුණි. | මු.රෙ. 371 (5) වසර 35 ක කාලයක සිට පැවත එන පැරණි ශේෂය බැවින් ඉදිරියේදි නිරවුල් කිරිමට පියවර ගන්නා බව | අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.43,466,570 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු41,565,879 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| )i) | වරිපනම් හා බදු | 17,944,000 | 18,230,346 | 20,894,910 | 15,894,141 | 17,600,000 | 19,310,897 | 16,615,917 | 18,558,706 |
| (ii) | කඩ කුලී | 29,820,000 | 17,865,947 | 17,762,904 | 9,680,005 | 29,195,000 | 14,247,236 | 16,357,087 | 9,576,962 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,700,000 | 875,091 | 875,091 | - | 3,600,000 | 819,207 | 819,207 | - |
| (iv) | වෙනත් ආදායම් | 27,578,000 | 20,259,081 | 16,371,755 | 16,751,675 | 127,184,000 | 10,648,290 | 8,378,563 | 12,864,349 |
| | | 79,042,00 | 57,230,465 | 55,904,660 | 42,325,821 | 177,579,000 | 45,025,630 | 42,170,774 | 41,000,017 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| (අ) වරිපනම් බදු<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු.8,406,716 ක් විය. ඒ තුළ වසර 10 ට වැඩි පරිශ්‍ර 07 ක රු.50,484 ක්, වසර 05 ත් 10 ත් අතර පරිශ්‍ර 432 ක රු.2,439,721 ක් හා වසර 01 සිට වසර 05 ත් අතර කාලයට අදාළ රු. 5,257,669 ක මුදලක් අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකරගැනීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුව හිඟ ආදායම් අය කළ යුතුය. |

(ආ) කුලී

------

| | | | |
|---|---|---|---|
| i. | හැටන් තානායම කුලියට දීමෙන් 2018 හා 2019 වර්ෂයට අදාළව අයවිය යුතු රු.1,581,710ක කුලිය සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී මුදල් ගෙවීම් කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඇති බව. | හිඟ ආදායම් අය කළ යුතුය. |
| ii. | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කඩ කාමර 441 ක හිඟය රු.9,680,005 ක් විය. ඒ අතර වසර 03 ට වඩා වැඩි කාලයක සිට කුලී අයවිය යුතු මස්,මාළු කඩහිමියන් 09 දෙනෙකුගෙන් රු.5,299,694 ක් අයකර නොතිබුණු අතර ඉන් 06 දෙනෙකුගෙන් රු.405,964 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි. හිඟහිටි කුලිය අවුරුදු 01 ත් 03 ත් අතර කඩහිමියන් 41 කින් රු.1,133,297 ක්ද, හිඟිටි කුලිය අවුරුදු 03 ට වැඩි කඩහිමියන් 12 කින් රු.201,527 ක්ද, අයවිය යුතුව පැවතුණි. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගන්නා බව. | - එම - |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

| | | |
|---|---|---|
| පළාතේ ප්‍රධාන ලේකම් හා අනෙකුත් බලධාරියාගෙන් ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු. 8,745,700 ක් විය. | ඉතිරි මුදල් ලබාගැනීමට උපලේඛන ගාස්තු ගෙවා ඇති බව. | ආදායම් ගෙන්වා ගත යුතුය. |

(ඈ) වෙනත් ආදායම්

------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 2,867,975 ක ඉඩම් බදු ශේෂයක් අයවිය යුතුව පැවතුණි. | හිඟය ගෙවීම් කරන ලෙසට දන්වා ඇති බව | හිඟ ශේෂ අයකළ යුතුය. |

03. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

----------------------------------------------

නගර සභා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කාර්ය සාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී එළඹෙන වර්ෂ වලට අදාල කාර්ය සාධන වාර්තා අදාල වර්ෂයන්හි පිළියෙල කිරිමට කටයුතු කරන බව | කාර්ය සාධන වාර්තා පිළියෙල කළ යුතුය. |
| (ආ) | පරිසර බලපත්‍ර ලබාදී තිබූ ආයතන 14 ක් පරිසර බලපත්‍රවල වලංගු කාලය ඉකුත් වී තිබූ නමුත් බලපත්‍ර අළුත් කිරිමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම කටයුතු සිදු කරන බව | පරිසර බලපත්‍ර ලබාදීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 1987 අංක 18 දරන නගර සභා ආඥා පනතේ IV වන කොටස 103 වගන්තිය පරිදි නගර සභා බල ප්‍රදේශයේ පරීක්ෂාවට ලක්කළ ආපනශාලා 29 ක් ආහාර පරිශ්‍ර ශ්‍රේණිගත කිරීම් අනුව පැවතිය යුතු නිර්ණායක සපුරා නොතිබුණද, ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | ආපන ශාලා වර්ගීකරණය කරමින් පවතින බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | දැන්වීම් පුවරු ගාස්තු අයකිරීමට අදාල අතුරු ව්‍යවස්ථා පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව | සමීක්ෂණය කර ගාස්තු අය කිරීමට ක්‍රියා කළ යුතුය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කඩ කාමර 47 ක බදුකරුවන් සමඟ අත්සන් කරන ලද ගිවිසුම් කාලය අවසන් වී වසර 05 සිට වසර 25 දක්වා කාලයක් ගතවී තිබුණද, ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | බදුකරුවන් හට ගිවිසුම අලුත් කරගැනීමට කටයුතු කරන ලෙස දැනුවත් කර ඇති බව. | කඩහිමියන් සමඟ ගිවිසුම්වලට එළඹීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවට අයත් කඩ කාමර 10 ක් අනවසරයෙන් අතුරු බදු දී ඇති බව හඳුනාගෙන තිබුණද, ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | අවසරයකින් තොරව අතුරු බදු දී ඇති කඩහිමි බදුකරුවන් සඳහා එම අතුරු බදු දීම නවත්වන ලෙස දැනුම්දී ඇති බව. | නීති මඟින් කටයුතු කළ යුතුය. |
| (ඇ) | නගර සභා බල ප්‍රදේශයේ පවතින කඩ කාමර 314 ක 2020 සහ 2021 වර්ෂවලදී අවස්ථා 02 කදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී තිබුණ තක්සේරු වාර්තා අනුව කඩකුලී අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයේ ජුනි සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා මාස 19 ක කාලයක් තුළ කඩ කාමර 314 කින් රු.15,481,979 ක කුලී අය කර නොතිබුණි. | ගෙවිය යුතු හිඟ මුදල් පිළිබඳව දැනුම්දී ඇති බව | තක්සේරු වාර්තා අනුව හිඟ ගාස්තු රැස් කළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂයට අදාළව සභාව වෙත ලැබී තිබුණු මහජන පැමිණිලි 07 කට අවශ්‍ය ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය දෙසැම්බර් 31 දින වනවිටත් ගෙන නොතිබුණි. | විසඳිය නොහැකි බැවින්, ඉදිරියේදී මෙය අදාල ආයතන වෙත යොමු කිරිමට කටයුතු කරන බව | මහජන සේවා නොපමාව ඉටුකළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 09 සිට වසර 13 දක්වා කාල පරාසයක් ගත වී ඇති රු.9,985,139 ක ගිණුම් ශේෂ 03 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව | ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 04 සිට වසර 12 දක්වා කාල පරාසයක් ගත වී ඇති රු.4,393,414ක ගිණුම් ශේෂ 02 ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව | නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 2008 ට පෙර සිට පැවත එන රු.122,643 වූ පෙර ගෙවුම් ශේෂ 04 ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

3.3 වත්කම් කළමනාකරණය
------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හැටන් නගර මධ්‍යයේ පිහිටි විශාල ශාලාවක්, මුළුතැන්ගෙයක් හා වැසිකිළි පද්ධතියක් සහිත උත්සව ශාලාව හා හැටන් දික්ඔය කියවීම් ශාලාව හා පුස්තකාල ගොඩනැගිල්ල අළුත්වැඩියාවකින් හා නඩත්තුවකින් තොරව පවතින අතර පුස්තකාලය තුළ පොත් 3000 ක් සමඟ විනාශවීමට ඉඩහැර තිබුණි. | අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව | අලුත්වැඩියා කර නඩත්තු කළ යුතුය. |
| (ආ) | 2015 සහ 2020 වර්ෂවල එකතුව රු.552,780 ක් වැයකර සවිකරන ලද CCTV කැමරා පද්ධතිය නිසිලෙස ක්‍රියාත්මක තත්වයේ නොමැති අතර ගබඩා වූ දත්ත බාගත කළ නොහැකි වුයෙන් CCTV කැමරා සවිකිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි. | අලුත්වැඩියා කටයුතු කිරීම සඳහා අදාල ආයතන දැනුවත් කර ඇති බව | ක්‍රියාත්මක තත්ත්වයට අළුත්වැඩියා කළ යුතුය. |

3.4 අවිධිමත් ගණුදෙනු
---------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුද්ගලයින් 07ක් විසින් හැටන් බස් නැවතුම්පොල ආසන්නයේ වෙළඳ බලපත්‍රයක් හෝ රහිතව අනවසරයෙන් ගාස්තු ගෙවීමකින් තොරව ව්‍යාපාර කටයුතු කරමින් පැවතුණ ද සභාව අනවසර වෙළදාම සම්බන්ධයෙන් කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණි | මෙම ඉදිකිරීම් ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරන බව. | අනවසර වෙළදාම් නවතා දැමිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දීපවාලි උත්සව සමයේ ශබ්ද විකාශන යන්ත්‍රය මඟින් වෙළඳ ප්‍රචාරණ කටයුතු කිරීමේ කාර්ය සඳහා පුද්ගලයින් තිදෙනෙකු බඳවා ගැනීමට ටෙන්ඩර් කැඳවා තිබියදී ලේකම්වරයා විසින් කිසිදු ටෙන්ඩර් පටිපාටියකින් තොරව රු.225,000 කට පෞද්ගලික පාර්ශවයකට ටෙන්ඩර් ලබාදී තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතුය. |

3.5 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුළු පිරිවැය රු.4,936,438 ක හැටන් බස් නැවතුම්පල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රමයක් අනුගමනය නොකර එකම කර්මාන්තය ඇස්තමේන්තු 03 ක් ලෙස සකස් කර අනුමත සමිති වලට ලබාදීමට කටයුතු කර රු. 4,943,393 ක් වැය කර තිබුණි. එසේම පළමුවර හා දෙවන වර තාර ආලේපනය සඳහා රු.306,124 ක් වැඩිපුර ගෙවා තිබුණි. | විගණනයෙන් පෙන්වාදුන් පරිදි පළාත් ඉංජිනේරුගේ අධීක්ෂණය යටතේ ඉදිරි කටයුතු කරන බව | ප්‍රසම්පාදන නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

3.6 මානව සම්පත් කළමනාකරණය
----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාන මාරු වී ගොස් ඇති නිළධාරීන් දෙදෙනෙකුගේ නිවාස කුලී ආපදා ණය එකතුව රු.374,436 ක් වසර 02 ක කාලයක සිට අයකර නොතිබුණි. | මේ පිළිබඳව අදාල නිලධාරීන් වෙත ලිඛිතව දැනුම්දී ඇති බව | කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විශ්‍රාම ගිය,මිය ගිය හා සේවය හැරගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 11 දෙනෙකුගේ වසර 01 යි මාස 08 සිට වසර 03 දක්වා කාලයකට අදාළ රු. 1,513,655 ක ණය ශේෂ අයකර නොතිබුණි. | ඉදිරියේදි මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
------------------------------------
වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම
--------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදි එළඹෙන වර්ෂ වලට අදාල ක්‍රියාකාරි සැලැස්ම අදාල වර්ෂයන්හි පිළියෙල කිරිමට කටයුතු කරන බව | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුය. |